**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 13 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේදී කලින් ලද වරිපනම් බදු රු. 102,464 ක් වරිපනම් බදු ගිණුමට හර කර තිබීම හේතුවෙන් වරිපනම් බදු ආදායම රු. 204,928 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) 2018 වර්ෂය වෙනුවෙන් කලින් ලද රු. 149,767 ක වරිපනම් බදු කලින් ලද ආදායම් ගිණුම හර කර සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ගිණුමට බැර කර තිබීම හේතුවෙන් ආදායම රු. 299,534 ක් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව 2018 වර්ෂයේදී අපහරණය කර තිබූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලට ගැලපීම් කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු. 168,278 ක් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම හා උසාවි දඩ ආදායම නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර, පිළිවෙලින් රු. 9,000,000 ක හා රු. 1,000,000 ක ඇස්තමේන්තුගත ආදායම් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 50 ක වියදමින් ඉදිකර 2017 ජූනි 09 දින සභාව වෙත පවරා දී තිබූ බහුකාර්යය ගොඩනැගිල්ල හා සතිපොළ ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් දේපල, පිරියත සහ උපකරණ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පොදු ගබඩා තොග සහ පොදු ගබඩා ප්‍රීමික්ස් ගිණුම් වල එකතුව රු. 480,930 ක ශේෂයක් පැවතියද, භෞතිකව එවැනි ශේෂයක් නොවූයෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සභාවට අයත් ගොඩනැගිලි 12 ක පිරිවැය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**-----------------------**

ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 15,483,972 ක වෙනසක් විය.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන රු. 385,350 ක ගෙවිය යුතු එකතු කල අගය මත බදු ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 78,050,759 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | 204 වන රීතිය | | 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් පෙන්වා දී තිබූ භාණ්ඩ ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 32,930 | 2014 වර්ෂය තුල අවස්ථා 10 කදී ලබා දී තිබූ අතුරු අග්‍රිම පියවා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 1645 | | සභාවට අයත් වාහන වල ලොග් සටහන් පොත් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | සභාව සතු වාහන 03 ක් සම්බන්ධයෙන් නියමිත පරිදි ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන 1988 අගෝස්තු 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය | | |
| | IV (ආ) කොටසේ 5(5) වන අතුරු ව්‍යවස්ථාව | | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුල හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 27 ක් සඳහා |

එම ඉදිකිරීම් ඉවත් කර ගන්නා ලෙස හෝ නියමානුකූල කරගන්නා ලෙස ලිඛිත දැනුම් දීම් සිදුකර තිබුණද, ඊට ප්‍රතිචාර නොදක්වන ලද අනවසර ඉදිකිරීම් 23 ක් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,131,585 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,357,734 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,605,752 | 6,648,612 | 6,781,723 | 8,860,800 | 5,827,686 | 7,374,539 | 7,183,593 | 9,269,317 |
| කුලී | 2,078,640 | 1,855,444 | 2,071,623 | 1,402,993 | 2,876,100 | 1,859,880 | 2,803,700 | 1,619,272 |
| බලපත්‍ර ගාස්තු | 464,000 | 763,880 | 737,130 | - | 386,000 | 642,685 | 628,705 | 13,980 |
| වෙනත් ආදායම් | 13,172,000 | 14,175,199 | 8,901,345 | 23,273,718 | 13,097,000 | 13,978,843 | 8,052,678 | 18,019,898 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු හා වරෙන්තු හා දඩ යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 03, සියයට 59, සියයට 31 හා සියයට 122 කින් වැඩි වී තිබූ අතර වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 69 හා සියයට 40 කින් අඩුවී තිබුණි.

#### 2.2.3 වරිපනම්

2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් ශේෂය රු. 8,395,715 ක් වූ අතර, එම ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන වරිපනම් ඒකක 785 කට අදාල එකතුව රු. 4,001,337 ක

හිඟ ශේෂයක් පැවතුණි. හිඟ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

### 2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ)(i) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත සම්බන්ධයෙන් නීතිමය කටයුතු කල යුතු වුවත්, එම බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත හඳුනාගැනීමට සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු ආයතන 130 ක් එම බලපත්‍ර ලබාගෙන නොතිබීම හේතුවෙන් රු. 572,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබූ අතර, අදාල ව්‍යාපාර පවත්වාගෙන යාමේදී සිදුවිය හැකි පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීමක් සිදුකර නොතිබීම හේතුවෙන් සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ වගකීම ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි.

(ආ) වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ආයතන 19 ක් සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ) ව්‍යාපාර බලපත්‍ර ලබා ගතයුතු කර්මාන්ත හා ව්‍යාපාර 259 ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බලපත්‍ර ගාස්තු ගෙවා තිබුණද, 2017 සැප්තැම්බර් වනවිට නිකුත් කර තිබූ බලපත්‍ර ප්‍රමාණය 54 ක් පමණක් විය.

(ඇ) සභා බල ප්‍රදේශය තුල කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, වෙළඳ බලපත්‍ර ගාස්තු හා පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අය කල යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 මාර්තු සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව පැල්මඩුල්ල දිසා අධිකරණයෙන් අයවිය යුතු රු. 1,274,208 ක උසාවි දඩ 2018 අප්‍රේල් වනවිටත් අයකරගෙන නොතිබුණු අතර, 2017 මැයි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයෙන් අයවිය යුතු උසාවි දඩ ආදායම හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2015 අප්‍රේල් සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභා බල ප්‍රදේශය තුල පිහිටි සුසාන භූමි වල ඉඩම් අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පවතින අතර, කොමිෂන් සභාවේ නීතිරීති වලට අනුව එම ඉඩම් නොමිලයේ සභාව වෙත පැවරීමට නොහැකි බව 2017 මැයි 16 දිනැති හා අංක ED/LRC දරන ලිපිය මඟින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දන්වා තිබුණි. එසේ වුවද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව සහ මිනීපිටි ආඥා පනත යටතේ සුසාන භූමි සම්බන්ධ නිසි බලධාරියා ප්‍රාදේශීය සභාව වන බැවින් එම ඉඩම් පවරා දෙන ලෙස සභාව ඉල්ලුම් කර තිබුණද, 2018 මාර්තු වනවිටත් එම ගැටළුව නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1993 වර්ෂයේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් සභාවට ලබාදී තිබූ එහෙත් අයිතිය විධිමත්ව පවරාගෙන නොමැති කැබ් රථයක් ධාවන තත්ත්වයේ නොතිබීම හේතුවෙන් සභා භූමියේ ගාල් කර තිබුණි. කැබ් රථයේ අයිතිය සම්බන්ධයෙන් පවතින ගැටළුව නිරවුල් කරගෙන රථය අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) සභාව සතු ට්‍රැක්ටර් රථ 07 කින් 05 ක් මාස 02 සිට මාස 08 දක්වා කාලයක් ධාවනයෙන් තොරව නිෂ්කාර්යයව පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු රු. 613,004 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 05 කට අදාලව එකතුව රු. 4,660,500 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 83 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) | ආදායම් වැඩියෙන් සටහන් කිරීම |
| | | (iii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් උපයෝජනය | | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| (ඈ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |